2019/10/15
පිටු 1-3

106

**2020දී ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය 3.3%ක්** - ලෝක බැංකුව
>>P3

# 2020දී ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය 3.3%ක් - ලෝක බැංකුව

2019 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2.7%ක් ලෙස පැවැතියද, 2020දී ශ්‍රී ලංකා ආර්ථික වර්ධනය 3.3%ක් සහ 2021දී ආර්ථික වර්ධනය 3.7%ක් දක්වා ඉහළ යනු ඇතැයි ලෝක බැංකුව සඳහන් කරයි.

2019 වසරේදී ශ්‍රී ලංකාව 2.7%ක ආර්ථික වර්ධනයක් පමණක් අත්කර ගත්තද, පාස්කු ප්‍රහාරයෙන් පසුව හා දේශපාලන අර්බුදවලින් පසුව නැවතත් ආයෝජන යථා තත්ත්වයට පත්වීම, අපනයන වර්ධනය වීම හරහා මෙසේ ශ්‍රී ලංකා ආර්ථිකයේ වර්ධනයක් ඇතිවිය හැකි බව ලෝක බැංකුව සඳහන් කරයි.




මේ වසරේ ආර්ථික වර්ධනයන් තුළින් දකුණු ආසියාවේ ශ්‍රී ලංකාවට පසුපසින් සිටින්නේ ඇෆ්ගනිස්තානය පමණි. මේ වසරේදී දකුණු ආසියාවේ ඉහළම ආර්ථික වර්ධනය අත්කර ගැනීමට සමත්ව ඇත්තේ බංග්ලාදේශයයි. එය 8.1%කි.

දකුණු ආසියාව පිළිබඳ ඔවුන්ගේ නවතම වාර්තාවක මේ බව දැක්වෙයි.

සමස්තයක් ලෙස දකුණු ආසියාවේ ආර්ථික වර්ධනය මේ වසරේදී පහළ යනු ඇති බවද ලෝක බැංකුව සඳහන් කරයි. මේ වසර අවසන් වනවිට දකුණු ආසියාවේ ආර්ථික වර්ධනය 5.9%ක් දක්වා පහළ යනු ඇතැයිද ලෝක බැංකුව සඳහන් කරයි.